# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1808/1 – 2013 අප්‍රේල් 29 වැනි සඳුදා – 2013.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

ගාල්ල දිස්ත්‍රික්කයේ ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනාපීනුවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.ගා. 3891 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 ලෙස සඳහන් හෙක්. 0.0438 (අක්. 0 රූඩ් 0 පර්. 17.3) ක් වූ පන්සල්වත්ත නමැති ඉඩම.

උතුරට: ගා 3857 අංක දරන මූලික පිඹුරේ කැබලි අංක 54 සහ මාර්ගය; නැගෙනහිරට: නිග්‍රෝධාරාම මහා විහාරයේ විහාරාධිපති හිමිකම් කියන පන්සල්වත්ත; දකුණට: නිග්‍රෝධාරාම මහා විහාරයේ විහාරාධිපති හිමිකම් කියන පන්සල්වත්ත එච්. ඩබ්. පියල් හිමිකම් කියන අම්පිටිය බටදොඹගහවත්ත සහ මාර්ගය; බටහිරට: එච්. ඩබ්. පියල් හිමිකම් කියන අම්පිටිය බටදොඹගහවත්ත මාර්ගය සහ ගා 3857 අංක දරන මූලික පිඹුරේ කැබලි අංක 54.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූලි මස 03 වැනි දින පෙ.ව. 10.00 ට ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජූලි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

නිමල් ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
ගෝනාපීනුවල.

2013 මාර්තු මස 11 වැනි දින,
ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 320

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: ගම්/ප්‍රාලේ/2/2/1/30(III).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පහ නගර සීමාව තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්. 0.0044 ක් වූ ඉඩම් කොටස සඳහා සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ මිනුම් අධිකාරී විසින් මැන සකස් කළ මු.පි.ගම්. 3559 දරන 2007.01.26 දිනැති මූලික පිඹුරේ සහ එහි අංක 1 සහ 2 කැබලි වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2013.02.13 දාතමින් ඉදිරිපත් කල පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවේ විස්තර කෙරෙන පහත සඳහන් ඉඩම් කොටස්.

**කැබලි අංක 01**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ජී. පුෂ්පා අයිරාංගනී, අංක 59ඒ, ඔරුතොට පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්. 0.0021.

**කැබලි අංක 02**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ජී. පුෂ්පා අයිරාංගනී, අංක 59ඒ, ඔරුතොට පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්. 0.0005.

**කැබලි අංක 04**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ජී. පුෂ්පා අයිරාංගනී, අංක 59ඒ, ඔරුතොට පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්. 0.0010.

**කැබලි අංක 05**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ජී. පුෂ්පා අයිරාංගනී, අංක 59ඒ, ඔරුතොට පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්. 0.0008.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මැයි මස 20 වැනි දින පෙ.ව. 10.00 ට ගම්පහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 මැයි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

සී. පී. ඩබ්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2013 අප්‍රේල් මස 26 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

05 – 322

---

## ශුද්ධි පත්‍රිකාවයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ මා විසින් පළ කළ අංක 1553/8 හා 2008 ජුනි 10 දින හා 1794/1 2013 ජනවාරි 21 ගැසට් පත්‍රවල සඳහන් හිමිකම් පරීක්ෂණය හා වන්දි පරීක්ෂණය වෙනුවට 2013 ජුනි 5 වන දින පෙ.ව. 10.00 ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්. එම්. ආනන්ද,
ප්‍රාදේශීය ලේකම්,
පල්ලේපොල.

මගේ අංකය: 7/3/1/13/යුධ/හමු/අත්.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන
අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2005/ඩී/07.
2013 අප්‍රේල් මස 10 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.